


# අවමංගල්‍ය ස්තූතිය



මෙල්බන් නුවර විසූ 2016 ඔක්තෝබර් 06 වැනි දින අප අතරින් සමුගත් විශ්‍රාමික සංගීතාචාර්ණී අනුලා කරුණාරත්න මහත්මියගේ අවමංගල්‍ය කටයුතු සඳහා වැඩම කළ ගරුතර මහා සංඝරත්නයටත් අසනීප වූ අවස්ථාවේ සිට ප්‍රතිකාර කළ පවුලේ වෛද්‍ය වරුන්ටත්, Clayton Monash ආරෝග්‍ය ශාලාවේ වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලයටත්, අවමංගල්‍ය උත්සව කටයුතු සංවිධානය කළ බර්ට්‍රම් ඩයස් මහතාටත්, Bunurong Memorial Park හි සේවක මණ්ඩලයටත් රංගන - උදුම්බරා නර්ථන කණ්ඩායමේ ශිෂ්‍ය ශිෂ්‍යා වන් ඇතුළු ඔවුන්ගේ දෙමාපියන්ටත්, ඥාති හිතමිත්‍රාදී හා නන් අයුරින් උදව් කළ සැමටත් පවුලේ සැම වෙනුවෙන් හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කර සිටිමු.

**මෙයට ශෝකයටපත්,**
**එස්. කරුණාරත්න (ස්වාමියා) සුලානි සහ උදුම්බරා (දියණි යන්)**
**රංගන සහ උපේන්ද්‍ර (බෑණාවරු), තිලකා කුලතුංග (සොයුරිය)**

JAPANESE
By a qualified experienced teacher with proven results

PREP to VCE

- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.

Contact Number: 0425 396 975

**37 පිටෙන්**

බොහෝ සංවිධාන සහ සංගම් ඇති කළහ. පොරෙළුච්චික් කුළු (යුද නැගිටීම් කණ්ඩායම) තම සංවිධානයේ මාර්ගයෙන් බොහෝ කටයුතු ජනතා සහභාගිත්වයෙන් සිදු කෙරිණි. සංවිධානයෙහි රැස්වීම් සඳහා වන නිවේදන මගින් ජනතාව එක්රැස් කිරීම, වීර මරණයට පත් සටන්කාමීන්ගේ අවසාන කටයුතු සංවිධානය කිරීම යනාදී වශයෙන් ජනතා සංවිධාන ක්‍රම ක්‍රමයෙන් අරගලයෙහි ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කළේය. මේ අතර, දේශපාලන අංශයේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන කණ්ඩායම සංවිධානයෙහි බළ ඇණි සඳහා පිරිස් රැස් කරන කටයුතු ද වේගවත්ව ක්‍රියාත්මක කරන්නට විය. ගම් මට්ටමින් සමකාලීන දේශපාලනය පිළිබඳ සම්මන්ත්‍රණ අඛණ්ඩව පැවැත්විණි. වීදි නාට්‍ය සහ සංගීත වැඩසටහන් මාර්ගයෙන් ද සියලු දෙනා අරගලය සමඟ එක්විය යුතුය යන අදහස ඉතාමත්ම හැඟීම්බරව ඉදිරියට ගෙන ගියේය. තරුණ තරුණියන් එක්රැස්වන ස්ථානවල දැඩි ලෙසින් ප්‍රචාරක කටයුතු සිදු කළේය. දේශපාලන අංශයේ කථික ලැයිස්තුවේ මගේ නමත් ඇතුළත් වූ හෙයින් දිනපතා රැස්වීම් ගණනාවකම කථා පැවැත්වීමට සිදුවිය.

භූමිතෙල්වලින් පවා ක්‍රියාත්මක වන එම්.ටී. 90 වර්ගයේ යතුරු පැදියක් මගේ පාවිච්චිය උදෙසා ලබාදී තිබුණි. මුල දී යාපනය දිස්ත්‍රික්කයේද, පසුව වන්නි භූමියේ වීදිවලද ගමන් කිරීමට මගේ අරගල ජීවිතයේ විශාල කාලයක් වැය වීය.

1997 වසරෙහි මැයි මස 13 වන දින වන්නිය මුළුමනින්ම අත්පත් කරගැනීමේ අරමුණින් ලංකා හමුදාව 'ජය සිකුරු' හමුදා ක්‍රියාන්විතය ආරම්භ කළේය. වැලි ඔය ප්‍රදේශයෙහි සිට නෙඩුන්කේණි හරහා ද, වවුනියාව" නවය මාර්ගය ප්‍රදේශයෙහි සිට ඕමන්ත හරහාද වශයෙන් සටන් පෙරමුණු දෙකකින් මෙම හමුදා ක්‍රියාන්විතයන් සිදු කළේය. විමුක්ති කොටි සංවිධානය තම මුළු සටන් බලයම එක්රැස් කර 'කරනු' නැතහොත් 'මරණය වැළඳගනු' යන සටන් පාඨය සමඟින් හමුදා ක්‍රියා-න්විතයට මුහුණ දුන්නේය. වසර දෙක හමාරකටත් වඩා වැඩි කාලයක් දිග ඇදුණු මෙම යුද්ධ මෙහෙ-යුමට කාන්තා බල සේනාවන්ද තම ප්‍රමුඛ දායකත්වය ලබාදුන්නේය. සටන් පෙරමුණේ මහත් අත්දැකීම් සහිත සටන්කාමී සහෝදරියන්ගෙන් යුතුව සිටි මාලතී සේනාංකය 'ජය සිකුරු' යුද්ධ පෙරමුණෙහි අසමසම ධෛර්යකින් යුතුව සටන් කළෝය.

වන්නියෙහි අම්බකාමම් කැලෑ ප්‍රදේශයේ පිහිටා තිබූ කාන්තා අංශයේ මූලික පුහුණු කඳවුරුවල පුහුණුව ලැබූ සටන්කාමී සහෝදරියන්ව එක්කර මේජර් සෝදියාගේ නමින් හැඳින්වෙන නව කාන්තා බළසේනාවක් නායකතුමා විසින් ඇති කරන ලදි. යාපනයේ කරවෙට්ටි ප්‍රදේශයේ උපන් සෝදියා තමිල්නාඩුවෙහි ආයුධ පුහුණුව ලැබූ සටන්කාමින-යකි. ඇය අරගල බිමෙහි ද පරිපාලන කටයුතුවල ද මහත් දක්ෂතාවන් ප්‍රකට කළ සටන්කාමී සහෝදරියක් වූවාය. ආරම්භයේ දී වෛද්‍ය අංශයේ කටයුතු කළ ඇය පසුව කාන්තා සේනාංකයේ ප්‍රථම විශේෂ සේනා නායිකාව ලෙස නායකතුමා විසින් පත් කරන ලදි. ඇය අසනීප වී 1990.01.11 වන දින වැලි ඔය කැළෑ ප්‍රදේශයේදී මරණයට පත්වූවාය. ඇයගේ සිරුර යාපනයේ කිලාලි කාන්තා පුහුණු කඳවුරේදී භූමදානය කෙරිණි. පසුව එය 'මේජර් සෝදියා පුහුණු පාසල' යනුවෙන් නම් කළේය. මමද 1992 වසරේදී එම පාසලෙහි විසි එක්වෙනි කණ්ඩායමේ සාමාජිකාවක් ලෙස ආයුධ පුහුණුව ලැබුවෙමි. මෙම පුහුණු පාසල 1987දී විමුක්ති කොටි සංවිධානය විසින් කාන්තාවන් සඳහා උතුරේ ආරම්භ කරන ලද ප්‍රථම ආයුධ පුහුණු කඳවුරයි.

සෝදියා බලඇණියේ විශේෂ සේනා නායිකාව ලෙස දුර්ගා පත් කෙරුණි. ඇය ද ආරම්භයේදී වෛද්‍ය අංශයෙහි කටයුතු කළ අතර, පසුව ප්‍රහාරක නායිකාවක් ලෙස උසස්වීම් ලැබුවාය. මේජර් සෝ දියා බළඇණිය කැලෑ සටන් බළඇණියක් :ණමබ-ටකැ ජදපප්ඛි* වශයෙන් කටයුතු කිරීමට විශේෂයෙන් නිර්මාණය කළේය. නායකතුමාගේ බාහිර ආරක්ෂක කවය තුළ ද මෙම සේනාංකයට අයත් සටන්කාමියෝ බොහෝ දෙනෙක් කටයුතු කළහ.

'ජය සිකුරු' හමුදා මෙහෙයුම පරාජය කිරීමේ යුද්ධයේදී නැගෙනහිර පළාතට අයත් සටන්කාමීන්ගේ දායකත්වය මහත් විශාලය. ජේයන්තන් සහ අන්බරසි බළසේනාංක නැගෙනහිර පළාතේ සිට කැළෑ මාර්ගයෙන් සැතපුම් සිය ගණනක් පා ගමණින් පැමිණ හමුදා මෙහෙයුම්වලට සහභාගි වූහ. මුල්ලියවලෙ පුතන්වයල් ප්‍රදේශයේ පිහිටි අන්බරසි සේනාංකයේ කඳවුරට මම දේශපාලන පන්ති පැවැත්වීම සඳහා බොහෝ වාර ගණනක් ගොස් ඇත්තෙමි. මුල්ලියවලෙ රංගන් කඳවුරේදී නිතර නිතර කලා වැඩසටහන් පැවැත්වෙයි. ගී ගයන මාළුවන් සිටින නැගෙනහිර පළාතේ සටන්කාමී සහෝදර සහෝදරියෝ විශ්මිත කලා කුසලතාවන්ගෙන් යුතු පිරිසක් වූහ. ඔවුන්ටම අනන්‍ය වූ ශෛලියකින් යුතුව දෙමළ භාෂාව වහරන අයුරු ද සුන්දරය. මගේ සිත් ගත් බොහෝ මිතුරියෝ එම කඳවුරේ සිටියහ. වන්නි සටන් බිමෙහි නැගෙනහිර පළාතට අයත් සටන්කාමීන්ගේ දුෂ්කර ක්‍රියාකාරිත්වයත්, කැපවීමත් නොමැතිවන්නට විමුක්ති කොටි සංවිධානයට මහත් ජයග්‍රහණයක් ලැබීමට කිසිම අවස්ථාවක් නොමැත යන්න මට ස්ථිරවම පැවසිය හැකිය.

'ජය සිකුරු' හමුදා මෙහෙයුම පැවැති කාලය සටන්කාමීන් විසින් හඳුන්වනු ලැබුවේ 'කැලෑ සමය' ලෙසින්ය.

හාල් ඉතාමත් ස්වල්ප ප්‍රමාණයක්ද, ජලය අධික ප්‍රමාණයක් ද, ලුණු ද එක්කොට සෑදූ කැඳ පොලිතීන් බෑග්වලට දමා සටන් පෙරමුණට දිනපතා උදෑසන ආහාරය ලෙස ගෙන එන්නේය. දහවලට බත් සහ හරක් මස් හොද්දක් හෝ බටු හොද්දක් ද, රාත්‍රියට පිට්ටු සහ තක්කාලි හොද්දක් ද වශයෙන් වූ ආහාර, දැඩි වෙහෙස මන්සියෙන් සටන් පෙරමුණේ කටයුතු කළ සටන්කාමීන්ගේ කුස පිරවූවත් පෝෂණයක් ලබා දුන්නේ නැත. මොහොතින් මොහොත ගිගුම්දෙන සටන් පෙරමුණුවල සටන්කාමියෝ අධික ලෙසින් මරණයට පත්වෙමින් ද, බරපතල තුවාල ලබමින් ද උන්හ. මේ අතර තුවාල ලැබූ සටන්කාමීන් ඔවුන්ගේ තුවාල මුළුමනින්ම සුවවීමට පෙර නැවතත් සටන් පෙරමුණට යැව්වේය.

දහවන වතාවටත් තුවාල ලැබූ එක් සටන්කාමියෙක් එකොළොස්වන වතාවටත් නැවත සටන් පෙරමුණට යැවීමෙන් ඔහුට සටන් කිරීමට සිදුවිය. එමෙන්ම අධික රුධිර ගලනයට ලක්වූ අයට පෝෂණය නොලැබීම හේතුවෙන් තුවාල සුවවීම පමාවෙන බව පවසමින් වෛද්‍යවරු දුක්වූහ. මා දන්නා තරමින් සටන්කාමීහු දෙදෙනෙක් රක්ත හීනතාවය හේතුවෙන් මිය ගියහ.

**මතු සම්බන්ධයි**